පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය **07**

# දෙවන වාර පරීක්ෂණය - 2019

විෂයය **බුද්ධ ධර්මය**

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ......................................................
......................................................

කාලය : පැය **02** යි.

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බුදු රජාණන් වහන්සේගේ අනිමිසලෝචන පූජාව තුළින් ප්‍රකට වන ගුණය වන්නේ,
    (1) ඉවසීමේ ගුණය යි.
    (2) කළගුණ සැලකීමේ ගුණය යි.
    (3) තාදි ගුණය යි.

02. උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,
    (1) රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙල කර දීම යි.
    (2) මළ මුත්‍රා ආදිය කෙරෙහි පිළිකුල් නූපදවීම යි.
    (3) රෝගියාගේ සිත සැනසෙන පරිදි කතා නොකිරීම යි.

03. මිගාර මාතා නමින් ප්‍රසිද්ධියට පත් වූයේ,
    (1) විශාඛා සිටු දේවිය යි.
    (2) සුජාතා සිටු දේවිය යි.
    (3) කිසාගෝතමී දේවිය යි.

04. බුදු රජාණන් වහන්සේගේ 'පුරිසධම්ම සාරථී' බුදු ගුණයෙන් දමනය කළ පුද්ගලයෙකු නොවන්නේ,
    (1) අංගුලිමාල ය.
    (2) සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ය.
    (3) ආලවක යක්ෂයා ය.

05. සිරිත් ලෙස හඳුන්වනු ලබන්නේ,
    (1) කළ යුතු දේ කිරීම යි.
    (2) නොකළ යුතු දේ කිරීම යි.
    (3) කළ යුතු දේ නොකර සිටීම යි.

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළින් ගැළපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

  **(වැරදි, සිගාලෝවාද, අපණ්ණක, අටසිල්, යමක)**

06. ගුරු සිසු යුතුකම් ............................................... සූත්‍රයේ දැක්වේ.
07. 'අක්කොච්ඡි මං අවධි මං' යන ගාථාව ධම්ම පදයේ ......................... වග්ගයට අයත් වේ.
08. 'නිති පන්සිල්, පොහොය ....................................' යනුවෙන් කියමනක් වේ.
09. වචනයෙන් සිදුවන ............................................... හතරකි.
10. ඉවසිලිමත් බව හා විමසිලිමත් බව ............................. ජාතකයෙන් පිළිබිඹු වේ.

- **අංක 11 සිට 15 දක්වා ඇති වාක්‍යාංශවලට ගැළපෙන පිළිතුර තෝරා වරහන් තුළ පිළිතුරට අදාළ අංකය ලියන්න.**

| | | |
|---|---|---|
| 11. බුද්ධ කාරක ධර්ම | (.............) | 1. නවයකි |
| 12. දැහැමි රැකියාවකි | (.............) | 2. දස පාරමිතා |
| 13. ගිලානෝපස්ථානය | (.............) | 3. දෙව්රම් වෙහෙර |
| 14. ආනන්ද බෝධිය | (.............) | 4. කෘෂි කර්මාන්තය |
| 15. බුදු ගුණ | (.............) | 5. පූතිගත්ත තිස්ස හිමි |

- **අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16. ඉවසීමේ ප්‍රධාන ආනිශංස පහකි. (.............)
17. සාලිකේදාර ජාතකයෙන් මව්පියන්ට සැලකූ කුරුලු පැටවකුගේ කතාව ඉදිරිපත් කෙරේ. (.............)
18. දුටුගැමුණු කුමරු හා සද්ධාතිස්ස කුමරු අතර ගැටුම් ඇති වී නොමැත. (.............)
19. සමහර පුද්ගලයින් ජාතිය, ආගම, කුලය වෙනුවෙන් විරසක වෙති. (.............)
20. හොඳින් ඉගෙනීම ගුරුවරයාගෙන් සිසුවාට වන යුතුකමකි. (.............) (ලකුණු 2×20=40)

Education NCP - www.edncp.lk



LIVEWORKSHEETS